# මොරටුව මහ නගර සභාව



## වරිපනම් ලේඛණයේ අයිතිකරුවන්ගේ නම ලියාපදිංචි කිරීම සඳහා අනුගමනය කළ යුතු උපදෙස්

**මො.ම.න.ස/වරි/01 ආකෘති පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.**

ඒ අනුව............

01. ඔප්පු සාරාංශ පෝරමය නීතීඥවරයෙකු හෝ නොතාරිස්වරයෙකු විසින් සම්පූර්ණ කළ යුතුය.

02. මොරටුව මහ නගර සභාවේ වරිපනම් ලේඛණයට අනුව අයිතිකරුගේ නම සහ ඔප්පුවේ සඳහන් දීමනාකරුගේ නම එකිනෙකට සමාන විය යුතුය. අසමාන නම් සම්බන්ධතාවය ඔප්පු අංක සහිතව නොතාරිස්වරයෙකු විසින් පිළියෙල කරන ලද පෙළපත් වාර්තාවක් මගින් ඉදිරිපත් කළ යුතුය. ලේඛණගත අයිතිය, ''අයිතිකරු'' හෝ ''අයිතිකරු හිමිකම් කියයි'' යනුවෙන් සඳහන් අවස්ථා වලදී අවුරුදු 25 ක ඉඩමේ අයිතිය පිළිබඳ හිමිකම් වාර්තාවක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

03. මොරටුව මහ නගර සභාවේ වරිපනම් ලේඛණයට අනුව අයිතිකරුගේ නම සහ ඔප්පුවේ සඳහන් දීමනාකරුගේ නම එකිනෙකාට අසාමන හා අවුරුදු 25 ක ඉඩමේ අයිතිය පිළිබඳ හිමිකම් වාර්තාවේද ලේඛණගත අයිතිකරුගේ නම සඳහන් නොවන අවස්ථා වලදී අදාළ දේපල සම්බන්ධයෙන් ලේඛණගත අයිතිකරුට ඇති හිමිකම් පිළිබඳව නොතාරිස් / නීතීඥ තැන විශේෂයෙන් සඳහන් කළ යුතුය.

04. ඔප්පු සාරාංශ පෝරමයේ දේපල භාවිතා කරන වරිපනම් අංකය, පාරේ/වීථියේ නම හා අදාළ කොට්ඨාශය නිවැරදිව යෙදීම අත්‍යවශ්‍ය වෙයි.

05. ඉඩමක් බෙදා වෙන් කළ කොටසක් නම් ඉඩමේ ප්‍රමාණය, ගහකොළ, ගොඩනැගිලි සමඟ ද, නොමැතිව යන විස්තර හා මායිම් නිවැරදිව සටහන් කිරීම.

06. ඉඩමකින් නොබෙදූ කොටසක් නම්, ඉහත සඳහන් 05 වැනි ඡේදයේ විස්තර සමග මුල් ඉඩමෙන් කොතරම් ප්‍රමාණයකින් ද යන වග සඳහන් කරන්න.

07. ඔප්පු සාරාංශ පෝරමයේ දැනට අයිතිකරු/අයිතිකරුවන්ගේ නිවැරදි ලිපිනය සඳහන් කළ යුතුය.

08. ඔප්පු සාරාංශ පෝරමයේ නොතාරිස්/නීතීඥතැනගේ නිල මුද්‍රාව, අත්සන හා දිනය යෙදිය යුතුය.

09. ඔප්පු සාරාංශ පෝරමයේ සියලුම සංශෝධන, කපා හැරීම් සහ එකතු කිරීම් සඳහා නොතාරිස්/නීතීඥ තැනගේ නිල මුද්‍රාව හා කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

10. ඔප්පු සාරාංශ පෝරමය ඉදිරිපත් කරන අවස්ථාවේ පවතින කාර්තුව තෙක් සියලුම හිඟ වරිපනම් බදු ගෙවා අවසන් කළ යුතුය.

11. ඔබගේ අදාළ ඔප්පුවේ මුල් පිටපත හා එයට අදාළ මානක සැලැස්මේ මුල් පිටපත සමඟ ඡායාස්ථ පිටපත් 1 බැගින් අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතුය.

    (ඡායස්ථ පිටපත් කර ගැනීමෙන් පසු මුල් පිටපත ආපසු දෙනු ලැබේ.)

12. ඔබගේ අදාළ ඔප්පුවේ මුල් පිටපත හා එයට අදාළ මානක සැලැස්මේ මුල් පිටපත බැංකුවට ලබාදී ඇති අවස්ථාවක දී අදාළ බැංකුව මගින් සහතික කළ සත්‍ය පිටපත් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුයි.

13. 2013-03-01 දින සිට ලියන ලද ඔප්පු වරිපනම් නම හැරවීමට ඉදිරිපත් කිරීමේදී එම ඔප්පුව සඳහා මුද්දර ගාස්තු ගෙවූ රිසිට් පත හා එහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.